# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## දෙවන වාර විභාගය - 2019

## ගෘහආර්ථික විද්‍යාව පිළිතුරු පත්‍රය

## 1 පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 4 | 11. | 1 | 21. | 1 | 31. | 4 |
| 2. | 2 | 12. | 3 | 22. | 4 | 32. | 3 |
| 3. | 3 | 13. | 4 | 23. | 3 | 33. | 3 |
| 4. | 4 | 14. | 1 | 24. | 2 | 34. | 2 |
| 5. | 3 | 15. | 3 | 25. | 4 | 35. | 3 |
| 6. | 1 | 16. | 2 | 26. | 2 | 36. | 1 |
| 7. | 4 | 17. | 4 | 27. | 1 | 37. | 4 |
| 8. | 4 | 18. | 2 | 28. | 3 | 38. | 2 |
| 9. | 2 | 19. | 3 | 29. | 4 | 39. | 3 |
| 10. | 1 | 20. | 3 | 30. | 2 | 40. | 2 |

ලකුණු 1 * 40 = 40

## II පත්‍රය

පළමු ප්‍රශ්නය

I. වර්ණ ගැලපුම් වලට අනුව වර්ණ ගැන්වීම , ගෘහභාණ්ඩ උපකරණ මෙවලම් යෝග්‍ය ලෙස ස්ථානගත කිරීම , ස්ථානයට ගැලපෙන තිරරෙදි යොදා ගැනීම , විවිධ උපාංග යොදා ගැනීම

II. තම පවුල තුළ සම්පත් හඳුනා ගැනීම , සම්පත් සීමිත බව හා එම සීමිත සම්පත් ඵලදායිව යොදා ගැනීම , විකල්ප මාර්ග පිළිබඳව සැලකිලිමත් .

III. පරිභෝජනයට ගත් ආහාර ජීර්ණය අවශෝෂණය හා පරිවෘත්තියට භාජනය වී සිරුරට ශක්තිය ලබා දීම වර්ධනය හා පැවැත්ම ලෙඩ රෝග වලින් ආරක්ෂා කිරීම යන කාර්යය සඳහා උපයෝගී කර ගැනීමේ සමස්ත ක්‍රියාවලිය පෝෂණය ලෙස හැඳින්වේ.

IV. එක් එක් ආහාර කාණ්ඩය තුළ ඇතුළත් ආහාර වර්ග හඳුනා ගැනීමට , ආහාර පිරමීඩය තුළ ආහාර ද්‍රව්‍ය ගොනු වී ඇති ආකාරය හඳුනා ගැනීමට , ආහාර ද්‍රව්‍ය පෝෂණ අගය අනුව තෝරා ගැනීමට , ආහාර වේලක් තුළ අඩංගු කළ යුතු ආහාර කාණ්ඩ ප්‍රමාණ වශයෙන් තෝරා ගැනීමට

V. යම්කිසි ස්ථානයක ප්‍රධාන ගෘහභාණ්ඩ වලට අමතරව අලංකාරය ඇති කිරීමට / ඉටු විය යුතු කාර්යය නිසි පරිදි ඉටුවන සේ සැකසී ඇති දෑ උපාංග ලෙස හඳුන්වයි.

VI. මූලික මැහුම් ක්‍රම , විසිතුරු මැහුම් ක්‍රම , මැසීමේ ශිල්පීය ක්‍රමය

VII. බඳන යෙදීම, පයිපිං කිරීම , රේන්ද ඇල්ලීම , රැළි පටි ඇල්ලීම

VIII. දිග සෙ.මී. 52 හා පළල සෙ.මී. 52

IX. ගැටලු විසඳයි, තර්කානුකූල චින්තනය , නිර්මාණශීලි බව , නිරවුල් අදහස් දැක්වීම , තීරණ ගැනීමේ හැකියාව නායකත්වය ඇරීම

X. ඩිම්බ අවධිය , කලල අවධිය , භ්‍රෑණ අවධිය

ලකුණු 2 × 10 = 20

මුළු ලකුණු 20

2). I. කපු රෙදි - සිනිඳු බව හා මෘදු බවකින් යුතුවීම , නිතර සේදීමට හැකිවීම , ඉක්මණින් වියලීම හා මැදීමේ දී ඉහළ උෂ්ණත්වයට භාජනය කළ හැකි වීම, මනා අවශෝෂකතාවයකින් යුක්තවීම ලකුණු 03

ii. ඇඳුම ලිහිල්වීම , සරල පන්නයකින් යුතුවීම , ඇඟලෑමට හා පියවීමට පහසුවීම , මූට්ටු අවම වීම, විවර පියවීමට වේප් ඇල්ලීම , අලංකාර සරල මෝස්තර යෙදීම ලකුණු 03

iii. නිවැරදි අනුපිළිවෙල සඳහා

උරහිස් ( පැතලි මූට්ටුව ) , විවරය , කර , අත්කට , වාටිය මැසීමට ලකුණු 04

මුළු ලකුණු 10

3). i. සිරුරට අවශ්‍ය ශක්තිය ලබා දීම, සිරුරේ වර්ධනය හා පැවැත්ම සිරුර ලෙඩ රෝග වලින් ආරක්ෂා කිරිම, සඳහා ක්‍රියාකරන සිරුරට විෂ නොවන ඝණ හෝ ද්‍රව වශයෙන් ශරීරයට ලබා ගන්නා දේ ආහාර ලෙස හඳුන්වයි.

ලකුණු 03

ii.කාබන් දාමයේ හයිඩ්‍රජන් පරමාණු උපරිම දරා තිබෙන මේද අම්ල සංතෘප්ත මේද අම්ල වේ.

උදාහරණ - මිරිස්ටික්, පාමටික් , ස්ටියරික් , බියුටරික් , හැඳින්වීමට ලකුණු 01 නම් කිරීමට ලකුණු 02

iii. යකඩ අඩංගු ආහාර ඇතුළත්විය යුතුයි. ගර්භණී මවකට අවශ්‍ය පෝෂණය ලැබිය යුතුයි. මෙම කරුණු සැලකිල්ලට ගනිමින් ලියන ලද ක්‍රමවත් , විවිධත්වයකින් යුත් බොජුන් පතට ලකුණු 04

මුළු ලකුණු 10

4) i. විවිධ වූ අභ්‍යන්තර හා බාහිර බලපෑම් අනුව සිදුවන රසායනික හා භෞතික වෙනස්වීම් තුළින් ආහාරයට ආවේනික රසය , වර්ණය , වයනය , සගන්ධය හා පෙනුම වෙනස්වීම නිසා පරිභෝජනයට නුසුදුසු තත්ත්වයට පත්වීම ආහාර නරක් වීමයි. ලකුණු 03

ii. වියළීම - උපක්‍රමය - විජලනය මූලධර්මය - ජලය ඉවත්වීම නිසා ක්ෂුද්‍රජීවී වර්ධනයට බාධා ඇතිවේ.

ලුණු දැමීම - උපක්‍රමය - පරිරක්ෂණ කාරක භාවිතය මූලධර්මය - පී.එච්. අගය අඩුවීම . ආම්ලිකබව නිසා ක්ෂුද්‍රජීවී වර්ධනයට අහිතකර පරිසරයක් ඇතිවීම ලකුණු 03

iii. අඹ චට්නිය සැකසීමට අදාල නිවැරදි පියවරයන් ඔස්සේ ගැලීම් සටහන නිවැරදිව ලියා ඇත්නම් ලකුණු 04

මුළු ලකුණු 10

5) i. මූල්‍යමය පහසුකම් , භූමියෙහි ස්වාභවය , ඔප්පුවෙහි නිරවුල් බව , යටිතල පහසුකම් ( නළ ජලය , විදුලි බලය , පොදු ප්‍රවාහන , සෞඛ්‍ය සේවා ) ලකුණු 03

ii. වර්ණ චක්‍රයේ ප්‍රාථමික වර්ණයක් හා ඊට යාබදව ඇති වර්ණ දෙකක් හෝ තුනක් සම්බන්ධ කර ගනිමින් වර්ණ ගැලපීම බද්ධ වර්ණ ගැලපුමයි.
උදා . නිල් , නිල්කොළ , නිල්දම් , දම් / කහ , කහකොළ , කහතැඹිලි , තැඹිලි
කහ , කහතැඹිලි , තැඹිලි ,රතුතැඹිලි / රතු , රතුදම් , දම් ,නිල්දම් ලකුණු 03

iii. ගෘහ සම්පත් කළමනාකරණ ක්‍රියාවලියේ පියවරයන් නම් කර තිබීම සඳහා ලකුණු 01

එම පියවරයන් තුළින් පවුලේ අවශ්‍යතා හා අපේක්ෂා ඉටු කර ගන්නා ආකාරය , පවුලේ සාමාජිකයන්ට ලැබෙන මානසික තෘප්තිය , අන්‍යෝන්‍ය අවබෝධය , පවුලේ සමගිය හා සහයෝගිතාවය ඇතුළත් කරුණු සාකච්ඡා කිරීමට ලකුණු 03

මුළු ලකුණු 10

6) i. කිසියම් ස්ථානයක මධ්‍ය ලක්ෂයේ සිට දෙපසට සම දුරින් භාණ්ඩ ස්ථානගත කිරීම විධිමත් තුලනයයි. එහි දී භාණ්ඩ හැඩයෙන්, බරෙන් , ප්‍රමාණයෙන් ,මෝස්තරයෙන් හා වර්ණයෙන් එකිනෙකට සමාන විය යුතුය.

අවිධිමත් තුලනයේ දී කිසියම් ස්ථානයක හැඩයෙන් ප්‍රමාණයෙන් උසින් එකිනෙකට අසමාන ගෘහ භාණ්ඩ මධ්‍ය ලක්ෂයේ සිට අසමාන දුරින් ස්ථානගත කිරීම සිදු කරයි. ලකුණු 03

ii. සිරස් - උස් බව , දැඩි බව , උසස්බව , ඍජු බව , ශක්තිමත් බව

වක්‍ර - සුන්දර , ප්‍රීතිමත් , සන්සුන් , සිත්කලු , නැමෙන සුළු හා සියුම් බව

විකර්ණාකාර - කලබලකාරි බව , නොසන්සුන් බව , ක්‍රියාශීලි බව , චලනය , රිද්මයානුකූල බව ලාලිත්‍යමය යනා දී කරුණු වලින් එකකට කරුණු දෙකක් තිබිය යුතුය. ලකුණු 03

iii. 1. සීමා මායිම් පවත්වා ගැනීම
2. පාංශු සංරක්ෂණය සඳහා පියවර ගැනීම
3. ජලය බැස යාම සඳහා උපක්‍රම යෙදීම
4. අලංකරණය ඇති කිරීමේ විවිධ ක්‍රම යොදා ගැනීම මින් 02 ක් නම් කිරීමට ලකුණු 01

විස්තර කිරිමට ලකුණු 03

මුළු ලකුණු 10

7) i. කායික පරිණතිය - වයස , කායික වර්ධනය

මානසික පරිණතිය - දෙමාපියන් වීමට ඇති මානසික සූදානම ලකුණු 03

ii. ගබ්සා ඇතිවීම , ප්‍රාග් පර්ණත දරු උපත් ඇතිවීම , මළ දරු උපත් ඇතිවීම , මන්ද මානසික දරු උපත් ඇතිවීම

ලකුණු 03

iii. මාතෘ සායනයක ප්‍රයෝජන හතරක් නිවැරදිව සඳහන් කිරීමට ලකුණු 04

මුළු ලකුණු 10